COMPLETED



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

1. පහත සඳහන් ඒවායින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) ඉජ්මා මත පදනම් වූ නීතිය ඉමාම් යුගයෙන් සම්පූර්ණ විය.
   (2) අල් කුරාණය නිර්මාණය වූ බව කලීෆා මඃමූන් පිළිගෙන ඇත.
   (3) සේනාධිපති තාරික් බින් සියාද් සින්ධු ප්‍රදේශය අත්පත් කර ගත්තේ ය.
   (4) කෝට්ටේ රාජධානියේ ජීවත් වූ මුස්ලිම්වරු බ්‍රිතාන්‍යයන් විසින් නෙරපන ලදී.
   (5) කදරිය්‍යා නිකාය මිනිසාගේ හැසිරීමේ නිදහස බලවත් සේ ප්‍රතික්ෂේප කළේ ය.

2. අබ්බාසීය කිලාෆතය බිඳ වැටුණේ ක්‍රිස්තු වර්ෂ
   (1) 1254 දී ය.
   (2) 1256 දී ය.
   (3) 1258 දී ය.
   (4) 1260 දී ය.
   (5) 1262 දී ය.

3. මාප්පිල්ලෙයි ලෙබ්බේ ආලිම් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර ආගමික පිබිදීමක් ඇති කළ වැදගත් පුද්ගලයෙකි. ඔහු විසින් ශ්‍රී ලංකාවේ ආරම්භ කළ අධ්‍යාපනික ආයතනය වන්නේ
   (1) මක්කියා මද්රසා ය.
   (2) මුර්සිය්‍යා මද්රසා ය.
   (3) කුල්ලිය්‍යතුර් රහ්මානියා ය.
   (4) මද්රසතුල් බාරි ය.
   (5) බහ්ජතුල් ඉබ්රාහීමියා ය.

4. ජාහිලිය්‍යා සමයේ විවිධ ආගමික විශ්වාස අනුගමනය කළ මිනිසුන් විය. ඔවුන් අතරින් පිළිම වන්දනාවෙන් වැළකී සිටි හනීෆ් කෙනෙකු වන්නේ
   (1) වරාකා බින් නව්ෆල් ය.
   (2) ඉම්රාඋල් කයිස් ය.
   (3) උත්බා බින් රබීආ ය.
   (4) අබුලහබ් ය.
   (5) අම්රු බින් ලුහයි ය.

5. අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස මිනිසාට ඉටු කිරීමට සිදුවන යුතුකම් දැක්වෙන කාණ්ඩය කුමක් ද?
   (1) ඉබාදත්, ඉමාරත්, විලායත්
   (2) ඉමාරත්, කිලාෆත්, දඃවත්
   (3) රිසාලත්, විලායත්, ඉමාරත්
   (4) කිලාෆත්, දඃවත්, විලායත්
   (5) ඉබාදත්, ඉමාරත්, කිලාෆත්

6. හදීස්, මතන් හා ඉස්නාද් ලෙස කොටස් දෙකකින් සමන්විත වේ. මේවායින් ඉස්නාද් යනු
   (1) හදීස් පැවසූ අයගේ නාම ලේඛනයයි.
   (2) සහීහ් හදීස් සමූහයකි.
   (3) ව්‍යාජ හදීස් ය.
   (4) හදීස් විවරණයකි.
   (5) හදීස් විචාරයකි.

7. ඉස්ලාම්, අධ්‍යාපනයට වැදගත් ස්ථානයක් දී ඇත. මධ්‍යකාලීන යුගයේ මුස්ලිම් විද්වතුන් විවිධ ක්ෂේත්‍ර යටතේ ග්‍රන්ථ රචනා කර ඇත. ඉස්ලාමීය ලෝකයේ කීර්තියක් ලබා ඇති ග්‍රන්ථ කිහිපයක් පහත දැක්වේ.
   A - අර්-රිසාලා
   B - මුකද්දිමා
   C - කිතාබුල් හින්ද්
   D - කානූන් ෆිත් තිබ්බ්
   E - සූරතුල් අර්ල්

   මේවා අතුරින් ෆික්හ් හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ග්‍රන්ථ දෙක වන්නේ
   (1) A හා B ය.
   (2) A හා C ය.
   (3) A හා D ය.
   (4) B හා C ය.
   (5) B හා D ය.

[ දෙවෙනි පිටුව බලන්න.

8. මුඃතසිලාගේ තර්කාන්විත අදහස තහනම් කළ කලීෆා වන්නේ
(1) අල්-මුතවක්කිල් ය.
(2) අල්-මුස්තන්සිර් ය.
(3) අල්-වාසික් ය.
(4) අල්-මුස්තරීන් ය.
(5) අල්-මුහ්තදී ය.

9. අල් හම්රා, ටජ්මහල් සහ කුතුබ් මිනාර් මුස්ලිම් ගෘහ නිර්මාණ ශිල්පයේ සුප්‍රසිද්ධ දයකත්වයන් ය. මේවා අතුරින් කුතුබ් මිනාර් පිහිටි රට
(1) ඉරාකය වේ.
(2) ඊජිප්තුව වේ.
(3) ඉන්දියාව වේ.
(4) සෞදි අරාබිය වේ.
(5) තුර්කිය වේ.

10. ඉස්ලාමීය ශිෂ්ටාචාරයේ කැපී පෙනෙන ලක්ෂණ අතුරින් වඩාත් ම නිවැරදි වන්නේ
(1) ලෞකික හා ආධ්‍යාත්මික සම්බන්ධතාවයි.
(2) ආගම හා ශිෂ්ටාචාරය දෙස වෙනස් ආකාරයෙන් බැලීමයි.
(3) මුස්ලිම්වරුන් බහුතර සංඛ්‍යාවක් වෙසෙන ප්‍රදේශවලට ගැළපීමයි.
(4) භෞතික පැත්ත නොසලකා ආධ්‍යාත්මික පැත්ත ගැන පමණක් උනන්දු කරවීමයි.
(5) ඉස්ලාමීය විද්වතුන්ගේ අදහස්වලට අනුව සංවිධානය වීමයි.

11. මුහම්මද් නබි (සල්) තුමා විසින් සකස් කරන ලද අකබා, මදීනා හා හුදයිබියා ගිවිසුම්වල ඇතුළත් වගන්ති කිහිපයක් පහත දක්වේ.
A - සෑම කෙනකුට ම ඔවුන්ගේ ආගමික ඉගැන්වීම්වලට අනුව ජීවත්වීමට අයිතියක් ඇත.
B - කණ්ඩායම් දෙක ම ඉදිරි වසර දහය තුළ යුද්ධයකට නො එළඹෙනු ඇත.
C - අපරාධයක් කරන ඕනෑම කෙනෙකු දඬුවම් ලැබීමට යටත් වේ.
D - මිනී මැරීම, සොරකම් කිරීම, පරදර සේවනය සහ බොරු චෝදනා කිරීම වැනි පාපකාරී ක්‍රියා නොකළ යුතු ය.
E - මුස්ලිම්වරු හා යුදෙව්වන් සුහද සම්බන්ධතාවක් පැවැත්විය යුතු ය. යුදෙව්වන්ට හෝ මුස්ලිම්වරුන්ට හෝ එරෙහි විදේශීය බලවේගවල දී ඔවුන් අන්‍යෝන්‍ය වශයෙන් උදව් කළ යුතු ය.
F - නිතර ම නබිතුමාට සහය විය යුතු අතර ඔහුගේ නායකත්වය පිළිගෙන ඉස්ලාමයේ සංවර්ධනයට උදව් කළ යුතු ය.
මේවායින් මදීනා ගිවිසුමට සම්බන්ධ වන්නේ
(1) A, B හා C ය.
(2) B, D හා E ය.
(3) C, D හා E ය.
(4) A, C හා E ය.
(5) A, C හා F ය.

12. නුබුව්වත් ලැබීමෙන් පසු නබි (සල්) තුමා මක්කා හා මදීනා හි ගත කළ කාලය දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) මක්කා හි වසර 11ක් හා මදීනා හි වසර 12ක්
(2) මක්කා හි වසර 10ක් හා මදීනා හි වසර 13ක්
(3) මක්කා හි වසර 12ක් හා මදීනා හි වසර 11ක්
(4) මක්කා හි වසර 08ක් හා මදීනා හි වසර 15ක්
(5) මක්කා හි වසර 13ක් හා මදීනා හි වසර 10ක්

13. 'ගනීමත්' යනු
(1) දිම්මිවරුන්ගෙන් අයකර ගනු ලබන බද්ද ය.
(2) ජයගත් අය යුධ බිමෙහි දී පරාජය වූවන්ගෙන් ගනු ලබන භාණ්ඩ ය.
(3) දේපළ හා ධනය මත අය කෙරෙන බද්ද ය.
(4) උරුමය ය.
(5) රජයේ ඉඩම් හා තණබිම් මත අය කෙරෙන බද්ද ය.

14. **6** වෙනි හිජ්රි වසර ඉස්ලාමීය ඉතිහාසයේ වැදගත් වසරකි. නබිතුමා හා සහාබිවරු ගසක් යට දී ප්‍රතිඥාවක් දුන්නේ ද මෙම වසරේ දී ම ය. මෙය 'බයිඅතුල් රිල්වාන්' නමින් හැඳින්වේ. මෙය සිදු වූ ස්ථානය කුමක් ද?
(1) දරුන් නද්වා
(2) අකබා කන්ද පාමුල
(3) දරුල් අර්කම්
(4) හුදයිබියා
(5) මස්ජිද් කුබා

15. ඉස්ලාමීය දේශපාලන සංකල්පයට අනුව ස්වාධිපත්‍යය අයත් වන්නේ
(1) අල්ලාහ්ට ය.
(2) රාජ්‍ය නායකයාට ය.
(3) සේනාධිපතිවරයාට ය.
(4) ආගමික විද්වතුන්ට ය.

[ තුන්වෙනි පිටුව බලන්න.

16. පහත දක්වෙන 'අ' තීරුවෙහි ග්‍රන්ථවල නම් ද 'ආ' තීරුවෙහි කතුවරුන්ගේ නම් ද දක්වේ.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| 1 | අල් උම්මු | A | ඉබ්නු ෂහරයාර් |
| 2 | අත්-තස්රීෆ් | B | ඉබ්නුල් හයිකම් |
| 3 | අජාඉබුල් හින්ද් | C | ඉමාම් ෂාෆිඊ |
| 4 | කිතාබ් අල් මනාසීර් | D | උමර් කය්යාම් |
| 5 | මකාලත් බිල් ජබ්ර් වල් මුකාබලා | E | අස්-සහ්රාවි |

'අ' තීරුවෙහි දක්වෙන ග්‍රන්ථ හා 'ආ' තීරුවෙහි දක්වෙන රචකයින් නිවැරදිව පිළිවෙළින් ගළපා ඇති පිළිතුර කුමක් ද?
(1) C, E, A, B, D
(2) A, B, D, E, C
(3) B, D, C, E, A
(4) A, C, B, D, E
(5) B, C, D, E, A

17. යෙර්මුක් හා කාදිසිය්‍යා යුද්ධවල දී මුස්ලිම් හමුදාවට නායකත්වය දී රෝම හා පර්සියන් අධිරාජ්‍ය අත්පත් කර ගත් සෙන්පතිවරු වන්නේ
(1) අබූ උබෙයිද හා මුතන්නා ය.
(2) කාලිද් බින් වලීද් හා සඅද් බින් අබී වක්කාස් ය.
(3) අම්රිබ්නුල් ආස් හා කාලිද් බින් වලීද් ය.
(4) සඅද් බින් අබී වක්කාස් හා අම්රිබ්නුල් ආස් ය.
(5) අබූ උබෙයිද හා කාලිද් බින් වලීද් ය.

18. පහත දී ඇති ඒවායින් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ආරම්භය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඉස්ලාම්හි පළමු ශතවර්ෂය තුළ දී ම ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙන ලදී.
(2) ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දීම සඳහා වගකීම දැරුවේ මෝගල් පාලකයකු වූ අවුරංගසීප් ය.
(3) මුස්ලිම්වරු ශ්‍රී ලංකාවේ පදිංචි වූයේ 15 වැනි ශතවර්ෂයේ දී ය.
(4) මොහොමඩ් බින් කාසිම් විසින් සින්ධු විජයග්‍රහණයත් සමඟ ම ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබී ය.
(5) මුස්ලිම්වරුන් මුලින් ම ශ්‍රී ලංකාවේ පදිංචි වීම මහනුවර රාජධානිය සමයේ දී සිදු විය.

19. වර්තමාන ඉස්ලාමීය පිබිදීමේ පුරෝගාමියකු වූ මොහොමඩ් බින් අබ්දුල් වහ්හාබ් (රහ්) ගේ උපත සිදු වූයේ,
(1) ගාසා හි දී ය.
(2) සාමිරා හි දී ය.
(3) හුමයිසරා හි දී ය.
(4) කුෆා හි දී ය.
(5) උයයිනා හි දී ය.

20. පහත සඳහන් ප්‍රකාශවලින් සත්‍ය **නොවන්නේ** කුමක් ද?
(1) අබ්බාසිවරුන් අයත් වන්නේ කුරයිෂි ගෝත්‍රයේ හාසිම් කුලයට ය.
(2) 'ෆත්හුද් දයාන්' රචනා කරනු ලැබුවේ මාපිල්ලෙයි ලෙබ්බේ ආලිම් විසිනි.
(3) සින්ධු පළාත මොහොමඩ් බින් කාසිම් විසින් අත්පත් කර ගන්නා ලදී.
(4) ඉමාම් අහමඩ් බින් හන්බල් (රහ්) අල් කුරාණය නිර්මාණය වූ බව පිළිගත් මුඃතසිලා චින්තනයට බලවත් සේ විරුද්ධ විය.
(5) කලීෆා මුආවියා (රලි) ඩැමස්කස් අගනුවර කර, උමයියාවේ පාලනය ස්ථිර කර උමයියා හා හාෂිමීවරුන් එක්සේසත් කළේ ය.

21. හදීස් කලාවේ 'අර්බයීන්' යනු
(1) මුතවාතිර් හදීස් පමණක් ඇතුළත් හදීස් ග්‍රන්ථයකි.
(2) සහීහ් හදීස් ඇතුළත් ග්‍රන්ථයකි.
(3) මව්ලූආත් හදීස් ඇතුළත් ග්‍රන්ථයකි.
(4) මුහද්දිස්වරුන්ගේ ජීවිතය ඉතිහාසය පිළිබඳ කෘතියකි.
(5) හදීස් හතළිහක් ඇතුළත් කෘතියකි.

22. 'අහ්ලුල් බයිද්' යනු කවුරුන් ද?
(1) ශුද්ධ ලියවිල්ල දෙනු ලැබූ යුදෙව්වන් හා කතෝලිකයින්
(2) මස්හබ් අනුගමනය කරන්නන්
(3) නබි (සල්) තුමාගේ පවුල හා ඔවුන්ගෙන් පැවත එන්නන්
(4) නිවසේ අයිතිකරුවන්
(5) තර්කානුකූල අදහස් ඇති කණ්ඩායම

- පහත සඳහන් ද සැලකිල්ලට ගනිමින් ප්‍රශ්න අංක **23 - 25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මවුලූආද්
B - අහ්ලූර් රඃයූ
C - තක්ලීද්
D - මුතවාතීර්
E - අල්-උර්වු
F - ඉල්මුල් ජරහ් වද් ත අතීල්
G - ඉන්ජාසිල් කුර් ආන්
H - තප්සීර් අල් මඃකූල්
I - ඉජ්තිහාද්
J - තර්තීබුන් නුසුල්

23. ෆික්හ් කලාව හා සම්බන්ධ අංග තුනක් වනුයේ
(1) A, D, J ය.
(2) C, E, G ය.
(3) B, C, I ය.
(4) E, F, G ය.
(5) B, D, G ය.

[ හතරවෙනි පිටුව බලන්න.

24. හදීස් කලාව හා සම්බන්ධ අංග තුනක් වනුයේ
(1) A, D, F ය. (2) A, C, E ය. (3) B, D, G ය. (4) C, E, J ය. (5) D, G, I ය.

25. තෆ්සීර් කලාව හා සම්බන්ධ අංග තුනක් වනුයේ
(1) C, E, I ය. (2) B, G, J ය. (3) A, D, H ය. (4) C, I, H ය. (5) G, H, J ය.

26. අල්-කුර්ආන් කට පාඩම් කරන අය හාෆිස් ලෙස හඳුන්වනු ලබයි. යමාමා යුද්ධයේ දී මෙම හාෆිස්වරුන් බොහෝ දෙනෙකු මරණයට පත් විය. මෙම යමාමා සටන සිදු වූයේ කුමන කලීෆාගේ සමයේ දී ද?
(1) අබූ බක්ර් (රළි)
(2) උමර් (රළි)
(3) උස්මාන් (රළි)
(4) අලි (රළි)
(5) උමර් බින් අබ්දුල් අසීස් (රහ්)

27. 20 වෙනි ශතවර්ෂයට පෙර ජනප්‍රිය ග්‍රන්ථ රාශියක් විය. ඒවා අතුරින් 'හුජ්ජතුල්ලාහ් අල් බාලිආ' රචනා කළේ කවුද?
(1) ඉමාම් ගසාලි (රහ්)
(2) ඉමාම් ඉබ්නු තයිමියා (රහ්)
(3) ෂෙයික් අබ්දුල් කාදර් ජීලානි (රහ්)
(4) ඉමාම් මුහම්මද් බින් අබ්දුල් වහ්හාබ් (රහ්)
(5) ඉමාම් ෂාහ්වලියුල්ලාහ් (රහ්)

28. ඉස්ලාමීය ලෝකයේ මුල් යුගය තුළ ආරම්භ කළ අධ්‍යාපනික ආයතන කිහිපයක හා ඒවායේ නිර්මාතෘවරුන්ගේ නම් අක්‍රමවත් පිළිවෙළට පහත දී ඇත.

| | |
|---|---|
| 1 - අල් අස්හර් විශ්ව විද්‍යාලය | A - කලීෆා මුස්තන්සීර් |
| 2 - නිලාමියා මද්රසා | B - කලීෆා මුඉස් |
| 3 - මුස්තන්සිරිය්යා මද්රසා | C - කලීෆා III වෙනි අබ්දුල් රහ්මාන් |
| 4 - මද්රසා සලාහියියා | D - ඇමති නිසාමුල් මුල්ක් |
| 5 - කුර්තුබා විශ්ව විද්‍යාලය | E - සුල්තාන් සලාහුදීන් අය්යූබි |

ඉහත අධ්‍යාපනික ආයතන හා නිර්මාතෘවරුන්ගේ නම් නිවැරදිව අනුපිළිවෙළට ගළපා ඇති පිළිතුර කුමක් ද?
(1) A, B, D, C, E (2) E, D, C, B, A (3) C, B, A, E, D (4) B, D, A, E, C (5) C, A, B, E, D

29. පෘතුගීසීන් විසින් මුස්ලිම්වරු කෝට්ටේ රාජධානියෙන් නෙරපා හරින විට, ඔවුන් තම රාජධානියට එකතු කරගත් රජු වන්නේ
(1) දෙවන රාජසිංහ ය.
(2) සෙනරත් ය.
(3) පළමුවන විමලධර්මසූරිය ය.
(4) වීර නරේන්ද්‍ර ය.
(5) ශ්‍රී වික්‍රම රාජසිංහ ය.

30. අල්-කුර්ආන් අනුගමනය කරමින් ඔබේ ජීවිතය සකස් කර ගැනීමට හේතුව
(1) එය පාරාදීසය පිළිබඳ ශුභ ආරංචියක් ලබා දෙන නිසා ය.
(2) එය ජීවිතය හා ඉන් පසුවට මාර්ගෝපදේශයක් පෙන්වා දෙන නිසා ය.
(3) එය මතක තබා ගැනීමට පහසු නිසා ය.
(4) දෙමව්පියන් එය අනුගමනය කිරීමට බල කරන නිසා ය.
(5) එය ගායනා කිරීමෙන් කුසල් රැස් කර ගත හැකි නිසා ය.

31. 'හදීතුල් ඉෆ්ක්' සම්බන්ධයෙන් අයේෂා (රළි) ට සම්බන්ධ කර චෝදනාවට ලක් වූ සහාබි කවුද?
(1) සෆ්වාන් බින් අල්-මුඃතල්
(2) මුහම්මද් බින් මස්ලමා
(3) සයිද් බින් හාරිද
(4) සඅද් බින් උබාද
(5) හයියාන් බින් සාබිත්

32. වර්තමාන ඉස්ලාමීය දඃවා ව්‍යාපාරයේ ආරම්භකයින්ගේ නම් ඇතුළත් නිවැරදි කාණ්ඩය කුමක් ද?
(1) මෞලානා ඉල්යියාස්, ඉමාම් හසනුල් බන්නාහ්, මෞලානා මෞදූදි
(2) සකරිය්යා සාහිබ්, හසන් හුදයිබි, යූසුෆ් ඉස්ලාහි
(3) මෞලානා ඉල්යියාස්, නයීම් සිද්දිකි, සෙයියද් කුත්බු
(4) මෞලානා මෞදූදි, උමර් තිල්මිසානි, මව්ලානා ඉන් අමුල් හසන්
(5) ඉමාම් හසනුල් බන්නාහ්, සෙය්යද් අබුල් හසන් අලි නද්වි, අබුල් ලෙයිස් ඉස්ලාහි

33. අල්-කුර්ආනයේ තෆ්සීර් කිහිපයක් පහත දක්වේ. තෆ්සීර්වල නම් හා ඒවායෙහි රචකයින් අක්‍රමවත් පිළිවෙළින් පහත දක්වා ඇත.

| | |
|---|---|
| 1 - තෆ්සීර් මෆාතිහුල් අයිබ් | A - මෞලානා මෞදූදි |
| 2 - තෆ්සීර් කුර් ආනිල් අලීම් | B - ෆක්රුතීන් රාසි |
| 3 - තෆ්සීර් මනාර් | C - ඉබ්නු කසීර් |
| 4 - තෆ්සීර් ෆී ලිලාලිල් කුර් ආන් | D - රෂීඩ් රිලා |
| 5 - තෆ්හීමුල් කුර් ආන් | E - සෙයියද් කුත්බු |

තෆ්සීර් හා ඒවායෙහි රචකයින් නිවැරදි අනුපිළිවෙළට සකස් කළ පිළිතුර කුමක් ද?
(1) A, B, C, D, E
(2) A, C, B, E, D
(3) B, C, D, E, A
(4) B, D, E, C, A
(5) C, B, A, D, E

[ පස්වෙනි පිටුව බලන්න.

34. ඉස්ලාමීය ඉතිහාසයේ 'කලීෆතුස් සාලිහ්' යන නාමයෙන් ගෞරව ලැබූ කලීෆා
(1) උමර් බින් අබ්දුල් අසීස් ය.
(2) වලීද් බින් අබ්දුල් මලික් ය.
(3) මඃමූන් බින් හාරූන් රෂීද් ය.
(4) අබ්දුර් රහ්මාන් බින් මුහම්මදු ය.
(5) මුහම්මද් අල් ෆාතිහ් ය.

35. උමය්යාද්, අබ්බාසි සහ උස්මානි රජ පෙළපත් විසින් ඉස්ලාමීය ලෝකය පාලනය කරනු ලැබී ය. උස්මාන්වරුන් තම කිලාෆතයේ අගනුවර කර ගත්තේ
(1) කයිරෝ ය.
(2) බැග්ඩෑඩ් ය.
(3) ඉස්තාන්බූල් ය.
(4) ඩැමස්කස් ය.
(5) කූෆා ය.

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නවල යෙදුම් දෙක බැගින් දී ඇත. මෙම යෙදුම් දෙක එකිනෙකට දක්වන සම්බන්ධතාව පහත **1** සිට **5** තෙක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නයෙහි යෙදුම්වලට වඩාත් ගැළපෙන සම්බන්ධතාව දක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1.** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **2.** | වැරදි ය. | වැරදි ය. |
| **3.** | වැරදි ය. | නිවැරදි ය. |
| **4.** | නිවැරදි ය. | වැරදි ය. |
| **5.** | නිවැරදි ය. | පළමුවැන්න මැනවින් පහද දෙයි. |

| | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| 36. | ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතියෙහි සියලු ම ෂරිආ පෞද්ගලික නීති ඇතුළත් ය. | ශ්‍රී ලංකාවේ මුස්ලිම් පෞද්ගලික නීතිය ලන්දේසි සමයේ දී අරාබියෙන් ලබා ගෙන ඇත. |
| 37. | අබූ මුස්ලිම් හුරාසානි ස්පාඤ්ඤයේ උමය්යාද් පාලනය ලබා ගැනීම සඳහා බොහෝ වෙහෙසුණේ ය. | උමය්යාද් සමයට අයත් හාරූන් රෂීඩ් බර්මකීවරුන්ගේ නැගීමට හා බිඳ වැටීමට හේතු විය. |
| 38. | රිවායත් මත පදනම් වූ කුර්ආන් වාක්‍යවල විවරණයට තෆ්සීර් මඃසූර් ය'යි කියනු ලැබේ. | නැමදුම කළ යුත්තේ අල්ලාහ්ට පමණක් බව තව්හීද් උලූහීය්‍යා මගින් තහවුරු කරයි. |
| 39. | කර්බලා හි සිදුවූ ඉමාම් හසන්ගේ ලේ වැගිරීම අහලුල් බයිද් පිළිබඳ මහජනතාවගේ අනුකම්පාව වැඩි වීමට හේතු විය. | ඉස්ලාමීය දේශපාලන ඉතිහාසයේ ෆාතිමීවරු හා සපවියත්වරු ෂියා අදහස්වලට පක්ෂව රාජ්‍ය බිහි කළ හ. |
| 40. | සිද්දි ලෙබ්බේ ඔහුගේ 'මුස්ලිම් නේසන්' පුවත්පත මගින් මුස්ලිම්වරුන් අතර දේශපාලන හා අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කළේ ය. | ශ්‍රී ලංකා මුස්ලිම්වරුන් අතර දේශපාලන ප්‍රබෝධයක් ඇති කිරීමට මාපිල්ලෙයි ලෙබ්බේ ආලිම්ගේ දායකත්වය ඉතා විශිෂ්ට විය. |

41. ඉමාම් මාලික් තුමා 'ඉමාමුල් මදීනා' යන ගෞරව නාමයෙන් අමතනු ලැබී ය. ඔහු විසින් රචනා කරන ලද ප්‍රසිද්ධ ග්‍රන්ථය
(1) රිසාලා ය.
(2) මුවත්තා ය.
(3) සීරතුන් නබී ය.
(4) ෆික්හුල් අක්බර් ය.
(5) බිර්රුල් වාලිදයින් ය.

42. උස්මානියා කිලාෆතයෙහි අවසාන කාලයේ 'මජල්ලතුල් අහ්කාමිල් අද්ලිය්යා' නම් ග්‍රන්ථය කුමන අංශය සඳහා ලියන ලද්දක් ද?
(1) ෆික්හ්
(2) හදීස්
(3) දර්ශනය
(4) තෆ්සීර්
(5) ගූඪවාදය

43. පහත දක්වෙන රජ පරම්පරා අතුරින් ඉන්දීය මුස්ලිම් නියෝජනය **නොකරන්නේ**
(1) කිල්ජී ය.
(2) පුවෙයි දි ය.
(3) ලෝදි ය.
(4) තුග්ලක් ය.
(5) අයිබක් ය.

44. විසිවෙනි ශතවර්ෂයේ මුල් වකවානුව තුළ ඉස්ලාම් මුහුණ දුන් තර්ජන අතර තුර්කිය ප්‍රමුඛ උස්මානියා කිලාෆතය බිඳ වැටීම ප්‍රධාන වේ. එය විනාශ වූ වර්ෂය
(1) 1922 ය.
(2) 1924 ය.
(3) 1926 ය.
(4) 1928 ය.
(5) 1930 ය.

45. සිෆීන් සටනේ දී උග්‍ර වූ ප්‍රශ්නය සාමයෙන් විසඳීමට කලීෆා අලි (රලි) ගේ හා මුආවියා (රලි) ගේ දෙපිරිසේ නියෝජිතයින් හමු වූ ස්ථානය
(1) අයින් ජාලූත් ය.
(2) තුර්මතුල් ජන්දල් ය.
(3) නහර්වාන් ය.
(4) කයිරවාන් ය.
(5) අජ්නාදීන් ය.

46. 'ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ජනවර්ගය අනුව ද්‍රවිඩ වේ. ආගම අනුව මුස්ලිම් වේ.' යනුවෙන් සර් පොන්නම්බලම් රාමනාදන් දැක්වූ අදහස ප්‍රතික්ෂේප කර, එය සත්‍යයට විරුද්ධ බව ප්‍රකාශ කරමින් 'ලංකාවේ මුස්ලිම්වරුන්ගේ මානව වංශ විද්‍යාව' නමැති කෘතිය රචනා කළ තැනැත්තා
(1) අයි. එල්. එම්. අබ්දුල් අසීස් ය.
(2) සිද්දි ලෙබ්බෙ ය.
(3) ඩබ්. එම්. අබ්දූර් රහ්මාන් ය.
(4) සර් මාකාන් මාකර් ය.
(5) එන්. ඩී. එච්. ඒ. ගෆූර් ය.

47. මුහම්මද් (සල්) කන්දක් මුදුනේ සිට තම පවුලේ අය අමතා ඔවුනට ද විවෘතව ඉස්ලාමයට ආරාධනා කළේ ය. එම කන්දේ නම කුමක් ද?
(1) ජබලු උහද්
(2) ජබලූර් රමාද්
(3) ජබලූර් රහ්මා
(4) ජබලු සෆා
(5) ජබලු සල්උ

48. පහත සඳහන් ඒවායින් මුෘතසිලා හි වැදගත් ධර්මයක් වන්නේ කුමක් ද?
(1) මහා පව් කරන තැනැත්තන් කාෆිර් වේ.
(2) ඉමාම්වරුන් පව් නොකරන අය වන අතර ඔවුන් පව් කිරීමෙන් ආරක්ෂා කරනු ලබයි.
(3) දුෂ්ඨ පාලකයින්ට විරුද්ධව සටන් කිරීම යුතුකමක් වේ.
(4) මිනිසාට ක්‍රියා කිරීමට නිදහසක් ඇත. ඔහුගේ ක්‍රියාවන්ගේ නිර්මාණකරු ඔහු ය.
(5) අල්ලාහ්, ඔහු කැමති නම් මහා පව් කළ කෙනෙකුට සමාව දෙයි; කැමති නම් දඬුවම් දෙයි.

49. ෆික්හ් හා හදීස් පිළිබඳ ලියැවුණු කෘතිවල විවිධ අරාබි පාරිභාෂික වචන ඇත. ඒවා අතුරෙන් 'මුත්තෆකුන් අලෛහි' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) ඉමාම් බුහාරි හා ඉමාම් මුස්ලිම් යන දෙදෙනා විසින් සඳහන් කරන ලද හදීස්
(2) ඉමාම් අබුහනීෆා හා ඉමාම් මාලික් යන දෙදෙනා විසින් දෙනු ලැබූ තීන්දු
(3) බැග්ඩෑඩ් හා ඊජිප්තුවේ දී ඉමාම් සාෆිඊ විසින් දෙන ලැබූ තීන්දු
(4) හදීස්හි කොටස් දෙකක් වන හදීස් නබවි හා හදීස් කුදුස්
(5) ඉමාම් බුහාරි හා ඉමාම් මුස්ලිම් විසින් වාර්තා නොකරන ලද හදීස්

50. සමාජයේ පැන නගින ආගමික ගැටලු සම්බන්ධයෙන් ඉස්ලාමීය මාර්ගෝපදේශය සොයා ගැනීමට කරනු ලබන උත්සාහය හැඳින්වෙනුයේ
(1) ඉජ්මා ලෙස ය.
(2) ජිහාද් ලෙස ය.
(3) කියාස් ලෙස ය.
(4) ඉජ්තිහාද් ලෙස ය.
(5) ඉස්ලාහ් ලෙස ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

**47 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

උපදෙස්:

- ✳ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ✳ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරා ගෙන පිළිතුරු සපයන්න.)

1. (i) 'අල් හදීස්' හා 'අස් සුන්නා' යන පදවල අර්ථය පැහැදිලි කරන්න.
   (ii) අල්-කුර්ආනය අවබෝධ කර ගැනීම සඳහා හදීස් අවශ්‍ය වන බව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
   (iii) නබිතුමාගේ කාලය තුළ හදීස් ආරක්ෂා කළ ආකාරය පැහැදිලි කරන්න.
   (iv) මවුලූආත් හදීස් බිහිවීමට හේතු සඳහන් කරන්න.
   (v) හදීස් කලාවේ වර්ධනයට ඉමාම් බුහාරිගෙන් ලැබුණු දායකත්වය අගය කරන්න.

2. (i) 'ෂිආ' යනු කවුරුන් ද? ඔවුන්ගේ ආරම්භයේ පසුබිම පැහැදිලි කරන්න.
   (ii) ෂිආවරුන්ගේ ප්‍රධාන ධර්ම පැහැදිලි කරන්න.
   (iii) හදීස් පිළිගැනීමේ දී ෂිආවරුන් අහ් ලුස් සුන්නා වල් ජමාඅත්වරුන්ගෙන් වෙනස් වන්නේ කෙසේ ද?
   (iv) ෂිආවරුන් අතරින් ඉමාමියියාවරුන් හා සයිදියියාවරුන් හඳුන්වන්න.
   (v) ෂිආවරුන් සහ කාරිජීවරුන්ගේ දේශපාලන මත සංසන්දනය කරන්න.

3. (i) සෞන්දර්යය පිළිබඳ ඉස්ලාමීය සංකල්පය පැහැදිලි කරන්න.
   (ii) ඉස්ලාමීය ලෝකයේ ලේඛන විද්‍යාවේ ආරම්භය පිළිබඳ සඳහන් කරන්න.
   (iii) ලේඛන විද්‍යාවේ වර්ග **හතර** සඳහන් කර, ඒවායේ ශෛලිය විස්තර කරන්න.
   (iv) මස්ජිදවල ගෘහ නිර්මාණ ශිල්පයේ ප්‍රධාන ලක්ෂණ මොනවා ද?
   (v) අල්-හම්රා මාලිගයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **තුනක්** තෝරා ගෙන පිළිතුරු සපයන්න.)

4. (i) මක්කා සමයේ දී නබිතුමාගේ දෑවා ක්‍රමවේදය ද එහි දී ඔහු මුහුණ දුන් තර්ජන ද සඳහන් කරන්න.
   (ii) ඉස්ලාමයෙහි ජයග්‍රහණයට හුදයිබිය්‍යා ගිවිසුම ආධාර වූයේ කෙසේ ද'යි පැහැදිලි කරන්න.

5. (i) ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ආරම්භය හා මුහුදුබඩ ප්‍රදේශයේ පළමු පදිංචි වීම පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   (ii) ශ්‍රී ලංකාවේ මුස්ලිම් අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා සිද්දි ලෙබ්බේ විසින් ඉටු කරන ලද කාර්ය භාරය සඳහන් කරන්න.

6. (i) මුස්ලිම්වරුන් භූගෝල විද්‍යාව කෙරෙහි උනන්දුවක් දක්වීමට තුඩු දුන් හේතු සඳහන් කරන්න.
   (ii) භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ වර්ධනයට දායක වූ මුස්ලිම් විද්‍යාඥයකුගේ සේවය ගැන පැහැදිලි කරන්න.

7. (i) අබ්දුල් මලික් තම පාලනයේ දී මුහුණ දුන් අභියෝග හා ඒවා මැඩ පැවැත්වූ අයුරු විස්තර කරන්න.
   (ii) වලීද් බින් අබ්දුල් මලික්ගේ කාලය තුළ දී ඉස්ලාමීය අධිරාජ්‍යය පැතිරුණු ආකාරය පැහැදිලි කරන්න.

8. (i) ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිරිහීම සඳහා හේතු පැහැදිලි කරන්න.
   (ii) නූතන ඉස්ලාමීය පුනරුත්ථාපනය සම්බන්ධ ඉමාම් බන්නාගේ හා මවුදූදිගේ අදහස් සංසන්දනය කරන්න.

***